එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 10වෙනි දින දවල් 12යේ කණිසමට කොළඹ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 10වෙනි දින කොළඹ කච්චේරියේදී.

ජේ. ජී. ෆ්‍රේසර්,
බස්නාහිර පලාතේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—ගොවිකම් දෙපාර්තමේන්තුවේ මුල්කන්තෝරුවේ මහතුන්ට ගෙවල් සෑදීමට සහ ලැබොරෙටොරියටද කන්තෝරුව සෑදීම පිණිසද මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරකමන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියම 7,228. ගම—පේරාදෙණිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | නිව්පේරාදෙණියේවත්ත | එලිමහන්ඉඩම | සිලෝන්ලෑන්ඩ් ප්‍රොඩියස් කොම්පැනිය | 0 0 3·3 |
| 2 | එම | අඩිපාර | එම | 0 0 34·6 |
| 3 | එම | තේ සහ රබර් වත්ත | එම | 2 1 7·1 |
| 4 | එම | තේ වත්ත | එම | 0 2 35 |
| 5 | එම | අඩිපාර | එම | 0 0 4·8 |
| 6 | එම | තේ සහ රබර් වත්ත | එම | 0 0 13·7 |

එබැවින් ඉඩම් අයිතිකර ගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 10වෙනි දින පස්වරු 2යේ කණිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 12වෙනි දින මහනුවර කච්චේරියේදීය.

සී. ඇස්. වෝන්,
මධ්‍යම පලාතේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—නුවරඑළියේ "විදුලිබලය" වැඩිදියුණු කිරීම සඳහා වතුර නලයක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ ඒ ඉඩමනම්:—

සිතියම නො. 7,211. ගම—නුවරඑළිය වට්ටම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | සල්ටාවත්ත | කැලෑව | නුවරඑළියේ සී. ඒ. හැස්ලොප් මහතා | 0 2 20·4 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 17වෙනි දින උදේ දහයේ කණිසමට නුවරඑළියේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 9වෙනි දින නුවරඑළියේ කච්චේරියේදීය.

ඒ. ටී. ඩයිසන්,
ආණ්ඩුවේ උපඒජන්ත වම්හ.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—අනුරාධපුර ත්‍රිකුණාමලේ පාරට ඉතුරුකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. ඩී. ඇස්. පී. පී. 761. ගම—වෙලන්කුලම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 24 | කිරියගහලන්ද | හේන | (1) සුද්දහාමිගේ නන්හාමි, (2) අප්පුහාමිගේ බන්ඩා | 0 2 17 |

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 60 | තට්ටන්කුලමකුඹුර .. | කුඹුර .. | (1) සුද්දහාමිගේ නන්හාමි, (2) අප්පුහාමිගේ බන්ඩා, (3) කදිරගේ ගමරාලගේ මල්හාමි ගමරාල, (4) එම අයගේ මුදලිහාමි ගමරාල, (5) පුන්චිරාලගේ කවුරාල, (6) රන්හාමිගේ පිංකිරිඅප්පු | 0 2 7 |

එබැවින් ඉඩම් අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 28වෙනි දින පස්වරු 2ගේ කාලසමට අනුරාධපුරේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 6වෙනි දින අනුරාධපුරේ කච්චේරියේදීය.

ඒ. ඩබ්ලිව්. සේමෝර්,
උ.ම. දි. ආණ්ඩුවේ ඒජන්ත වර්‍ය්‍යහ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—පත්බේරියේ සෝල්ලයේ ගෙල්ලම්පිට්ටනිය ආදිය පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියම 3,061. ගම—පත්බේරිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කාමරන්ගස්වත්තේහේන .. | හේන .. | ඒ. රණසිංහ සහ තව 5දෙනෙක් .. | 0 1 9·5 |
| 2 | එම .. | එම .. | එම .. | 0 0 9·3 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 5වෙනි දින උදේ 10ගේ කාලසමට පත්බේරියේ සෝල්ලයේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 7වෙනි දින කෑගල්ල කච්චේරියේදීය.

ඒ. ජී. රණසිංහ,
ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුවට.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—අරනායක කන්කුස්සියක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණලැබීතිබේ, ඒ ඉඩම් නම්:—

සිතියම 3,073. ගම—අරනායක.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | එගොඩවත්ත .. | වත්ත .. | කිරිබන්ඩා සහ තවත් 4දෙනෙක් .. | 0 0 4.4 |
| 2 | එම .. | එම .. | එම .. | 0 0 0·8 |

එබැවින් ඉඩම් අයිතිකර ගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරන අය වර්ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 14වෙනි දින උදේ 10ගේ කාලසමට කෑගල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 7වෙනි දින කෑගල්ලේ කච්චේරියේදීය.

ඒ. ජී. රණසිංහ,
ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුවට.

---

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

[කුරුණෑගල දැන්වීම නො. 7,953.]

වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 16වෙනි දින පටන් තුන්මාසයක් ඇතුලතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903ගේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇන්. ඒ. හැම්ප්ටන් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙණීසිට හෝ ලියවිල්ලකින්එකී ඉඩමට හෝ එහි කොටසකට කිසි අයිතිකමක් පෙන්වා සිටින්ට නොයෙදුනොත් එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඇන්. ඒ. හැම්ප්ටන්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

මෙකී ඉඩමට උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඉඩමට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

ඉඩමේ තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ දේවමැදිහත්පත්තුවේ ගිරාතලානේකෝරළේ කැකුණගහකොටුව යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනියන 1,695ගේ ලංකාමැනීමේ මුල් සිතියමේ 10න් පෙනෙන අක්කර 1කුත් රූඩ් 2කුත් පර්චස් 34ක් බිම්තරම ඇති සාමාන්‍ය වශයෙන් නුගගහමුලහේන් කියන නොහොත් ඒනමින් දැනගෙන තිබෙන බිම් කට්ටියට මායිම්—උතුරට රත්නායකමුදියන්සේලාගේ සොහොදිරාල හිටපු ආරච්චි සහ තවත් කෙනෙක් විසින් අයිතිකම් කියන නුගගහමුලහේනද; නැගෙනහිරට රත්නායකමුදියන්සේලාගේ සොහොදිරාල හිටපු ආරච්චි සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන නුගගහමුලහේනද, ආණ්ඩුව විසින් විකුණපු නුගගහමුලවත්තද; දකුණට ආණ්ඩුව විසින් විකුණපු කහටගහ මුලහේනද; බස්නාහිරට පනික්ගම යන ගමේ ගම්ඉමද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 1238වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කුරුණෑගල වි. ම. 82—1921.]

[කෑගල්ල දැන්වීම. නො. 7,954.]

වර්‍ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 16වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්‍ෂ 1897, 1899, 1900 සහ 1903යේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන් නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ෆ්‍රෙඩ්රික් එවිස් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ෆ්‍රෙඩ්රික් එවිස්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

මෙකී ඉඩම්වල නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

ඉඩම්වල තොරතුරු.

සබරගමු දිසාවේ කෑගල්ල දිස්ත්‍රික්කේ ගල්බොඩකෝරලේ ගල්බොඩපත්තුවේ වලගොඩ යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනියන මෙහි පහත දක්වන බිම්කට්ටි එනම්:—

ලංකාමැනීමේ මුල් සිතියම 174.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 33 | රේල්පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය | 0 | 1 | 1 |
| 33A | එම | 0 | 0 | 3 |
| 33B | එම | 0 | 0 | 7 |
| 33C | එම | 0 | 2 | 7 |
| 33D | එම | 0 | 2 | 8 |
| 33E | එම | 0 | 2 | 20 |
| | | 2 | 0 | 6 |

මීට මායිම්—උතුරට රේල්පාර සහ ඉතුරුකර තිබෙන බිම්කට්ටියද; නැගෙනහිරට රේල්පාර සහ ඉතුරුකර තිබෙන බිම්කට්ටියද ඉහලකෝට්ටේ යන ගමේ ගම්ඉමද; දකුණට මෙගස්සූරි මුදියන්සේලාගේ ඩිංගිරිඅප්පු විසින් අයිතිකම්කියන කබිහිලිහේනද (102,407 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩමෙන් කොටසක්) මෙගසූරිය මුදියන්සේලාගේ ඩිංගිරිඅප්පු විසින් අයිතිකම්කියන කබිහිලිහේනද, දෙකොන් පංගුවේ තක්සේරුවටදුන් කබිහිලිහේනද (322,809 යන පිඹුරුකඩදාසියේ පෙනියන ඉඩම), දෙකොන්පංගුවේ තක්සේරුවටදුන් ගලපාතගෙදරවත්තද, මුඩුබිම් සම්බන්ධ රෙගුලාසි යටතේ අයිතිවාසිකම් කියා සිටියාවූ අයට විකුණාපු කුහඹිලියාහේනවත්තද; බස්නාහිරට මලදෙලද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 1238වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කෑගල්ල වි. ම. 8—1921.]

---

## ඉල්ලුම්පත්‍ර සඳහා කරණලද දැන්වීම.

මෙහි පහත සඳහම්කරන ආණ්ඩුවේ ඉඩම් වර්‍ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් අවුරුදු දෙකකට බදුදීමට ටැන්ඩර් නොහොත් ඉල්ලුම්පත්‍ර බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නාබව මෙයින් දැනුම්දෙමි.

2. මෙම මුද්‍රකරනලද ටැන්ඩර් නොහොත් ඉල්ලුම්පත්‍ර වර්‍ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දිනවූ සිකුරාද දවල් 12ග වනතුරු කොළඹ කච්චේරියේදී භාරගෙන එදිනදී ඒවා කඩා බලනවා ඇත. ඉල්ලුම්පත්‍ර සැබෑබව ඔප්පුවීමට ඉල්ලුම්කරන් නාවූ සියළුදෙනාම ඒජන්ත උන්නාන්සේ ඉදිරියේ තමන්ම නොහොත් තමන් වෙනුවෙන් ක්‍රියාකරන්නෙක් පෙණීසිටින්ට ඕනෑය.

කොන්දේසි.

1. වැඩි ඉල්ලුම්කාරයා ගැනුම්කාරයාවේ.

2. බදුගත් මුදලෙන් අටෙන් කොටසක් ඇපයක් වසයෙන් වෙන්දේසි දිනේදීම බඳින්ට ඕනෑවා සහ එක එක කාර්තුවට සමසමව වැටහෙන මුදල එක එක කාර්තුව පටන්ගන්ට මත් තෙන් බදුකාරයා විසින් ගෙවන්ටත් ඕනෑය.

3. බදුකාරයාට අයිතිව තිබෙන්නේ ගස්වල ප්‍රයෝජනය පමණක්ය.

4. බදුකාරයාට හෝ ඔහුගේ වැඩකරුවන්ට ඉඩමේතිබෙන ගහක් කපන්ටවත් දැනට පවතින මායිමක් හෝ වැටක් වෙනස් කරන්ටවත් අවසර නැත.

5. බදුකාරයා විසින් බදුගත් ඉඩමේ වැට බඳින්ට ඕනෑය කියා ඒජන්ත උන්නාන්සේ විසින් අණකරන්ට යෙදුනොත් එසේ වැටවල් බඳින්ට බදුකාරයා බැඳෙනවා ඇත.

6. බදුකාරයා ඉඩම සුද්දෙන් සහ හොඳකාර තබාගන්ටත් නාගරික සභාවේ අණපණත්වල හැටියට පිළිපදින්ට සහ එහි නියමවල හැටියට බදු ගෙවන්ටත් ඕනෑය.

7. බදුකාරයාට මාසයකට ප්‍රථම දැනුම්දී ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ හෝ උන්නාන්සේගේ බලය යටතේ ක්‍රියාකරණ කොයිම කෙනෙකුට නුමුත් ඉඩමේ භුක්තිය නැවත භාර ගැණීමට කොයියම් විටකදී නුමුත් අයිතිවාසිකම තබාගන්නා ඇත.

8. ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ලියවිල්ලකින් ගන්නාලද අවසරයක් නැතුව ඉඩමේ බද්ද කිසි කෙනෙකුට පවරන්ටවත්, නැවත බදු දෙන්ටවත් බදුකාරයාට බලය නැත.

9. මුළු ඉඩම හෝ ඉඩමෙන් යම් කොටසක් ආණ්ඩුවට ඕනෑ කලොත් මාසයක් කල්දුන්විට ආණ්ඩුවට භාරදිය යුතුයි. එසේ ආණ්ඩුව විසින් නැවත භාරගන්නා ඉඩම හෝ ඉඩම් කොටසට ගතවෙන්ට තිබෙන බද්දෙන් ඒ ප්‍රමාණයට ඉදිරියට ගතවෙන්ට තිබෙන කාලයට බදු මුදලින් ආපසු ගෙවන්ට යෙදෙනවා ඇත.

10. ඉහත සඳහන්වෙන කොන්දේසි කඩකලොත් වන්දි මුදලක් නොගෙවා බදුකාරයා සහ ඔහුගේ වැඩකරුවන්වත් ඉඩමෙන් අහක්කර ඉඩමේ භුක්තිය ආණ්ඩුවේ ඒජන්ත උන් නාන්සේට නැවත ගැණීමට බලය තිබේ.

11. යම්කිසි ඉල්ලුම්පත්‍රයක් හෝ සියළුම ඉල්ලුම්පත්‍ර ප්‍රතිකෂෙප කිරීමේ බලය ඒජන්ත උන්නාන්සේ වෙත තබා ගන්නා ඇත.

ජේ. ජී. ෆ්‍රේසර්.
බස්නාහිර පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

වර්‍ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 8වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

කියන්නේ මේ ඉඩම් ගැණයි.

මුල් සිතියමේ නො. 14,349.

| බිම්කට්ටිය. | පිහිටීම. | අන්දම. | බිම්තරම. අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|
| 882 | කහත්ත | තණකොලවත්ත | 4 | 0 | 24 |
| 886 | එම | එම | 7 | 0 | 17·25 |

---

මෙහි පහත සඳහම්කරණ ආණ්ඩුවේ ඉඩම් වර්‍ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් එක අවුරුද්දකට බදු දීමට ටැන්ඩර් නොහොත් ඉල්ලුම්පත්‍ර බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් බාරගන්නාබව මෙයින් දැනුම්දෙමි.

2. මෙම මුද්‍රකරණලද ටැන්ඩර් නොහොත් ඉල්ලුම්පත්‍ර වර්‍ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 28වෙනි බදාදා දවල් 12 වන තුරු කොළඹ කච්චේරියේදී භාරගෙණ එදිනදී ඒවා කඩා බලනවා ඇත. ඉල්ලුම්පත්‍ර සැබෑ බව ඔප්පුවීමට, ඉල්ලුම්

කරන්නාවූ සියළු දෙනාම ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ ඉදිරියේ තමන්ම නොහොත් තමන් වෙනුවෙන් ක්‍රියාකරන් නෙක් පෙණීසිටින්ට ඕනෑය.

කොන්දේසි.

1. ඉඩම් දෙකට වෙන්වශයෙන් ටැන්ඩර් දෙකක් භාර ගනුලැබේ.

2. බදුමිල වෙන්දේසි දිනේදී සම්පූර්ණයෙන් ගෙවන්ට ඕනෑය.

3. බදුකාරයාට අයිතිව තිබෙන්නේ ගස්වල ප්‍රයෝජනය පමණක්ය.

4. බදුකාරයාට හෝ ඔහුගේ වැඩකරුවන්ට ඉඩමේ තිබෙන ගසක් කපන්ටවත් දැනට පවතින මායිමක් හෝ වැටක් වෙනස් කරන්ටවත් අවසර නැත.

5. බදුකාරයා විසින් බදුගත් ඉඩමේ වැට බඳින්ට ඕනෑය කියා ඒජන්ත උන්නාන්සේ විසින් අණකරන්ට යෙදුනොත් එසේ වැටවල් බඳින්ට බදුකාරයා බැඳෙනවා ඇත.

6. බදුකාරයා ඉඩම සුද්දෙන් සහ හොඳකාර තබාගන්ටත් නාගරික සභාවේ අණපනත්වල හැටියට පිළිපදින්ට සහ එහි නියමවල හැටියට බදු ගෙවන්ටත් ඕනෑය.

7. බදුකාරයාට මාසයකට ප්‍රථම දැනුම්දී ඒජන්ත උන්නාන්සේ හෝ උන්නාන්සේගේ බලය යටතේ ක්‍රියාකරණ කොයිම කෙනෙකුට නුමුත් ඉඩමේ භුක්තිය නැවත භාරගැණීමට කොයියම්විටකදී නුමුත් අයිතිවාසිකම තබාගන්නා ඇත.

8. ඒජන්ත උන්නාන්සේගෙන් ලියවිල්ලකින් ගන්නාලද අවසරයක් නැතුව ඉඩමේ බද්ද කිසිකෙනෙකුට පවරන්ටවත් නැවත බදුදෙන්ටවත් බදුකාරයාට බලය නැත.

9. ඒජන්ත උන්නාන්සේට ඕනෑය කියා හිතෙන ගස් කොපමනවුවත් කපාදමන්ට නිදහස තබාගන්නා ඇත. ඊට පාඩුවට වැටහෙන මුදලක් බදුකාරයාට ආපසු ගෙවනුලැබේ.

10. මුළු ඉඩම හෝ ඉඩමෙන් යම් කොටසක් ආණ්ඩුවට ඕනෑ කලොත් මාසයක් කල්දුන්විට ආණ්ඩුවට භාරදිය යුතුයි. එසේ ආණ්ඩුව විසින් නැවත භාරගන්නා ඉඩම හෝ ඉඩම් කොටසට ගනවෙන්ට තිබෙන බද්දෙන් ඒ ප්‍රමාණයට ඉදිරියට ගනවේන්ට තිබෙන කාලයට බදු මුදලින් ආපසු ගෙවන්ට යෙදෙනවා ඇත.

11. ඉහත සඳහන්වෙන කොන්දේසි කඩකලොත් වන්දි මුදලක් නොගෙවා බදු ගැණුම්කාරයා සහ ඔහුගේ වැඩකරුවන් ඉඩමෙන් අහක්කර ඉඩමේ භුක්තිය ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට නැවත ගැණීමට බලය තිබේ.

12. යම්කිසි ඉල්ළුම්පත්‍රයක් නොහොත් සියළුම ඉල්ළුම්පත්‍ර ප්‍රතික්ෂේපකිරීමේ බලය ඒජන්ත උන්නාන්සේ වෙත තබාගන්නා ඇත.

ජේ. ජී. ෆ්‍රේසර්,
ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 13වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

කියන්නේ මේ ඉඩම් ගැණයි.

මුල් සිතියමේ නො. 14,349. පිහිටීම—කනත්ත.

| බිම්කට්ටිය. | ඉඩමේ අන්දම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 892 | තණකොලවත්ත .. | 2 0 29·50 |

මුල් සිතියමේ නො. 11,350. පිහිටීම—බම්බලපිටිය.

| | | |
|---|---|---|
| 11,795, 11,596 සහ 11.797 | පිට්ටනිය .. | 2 3 30 |

වර්ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 11වෙනි දින මෙහි පහත සඳහන්වන ආණ්ඩුවේ ඉඩම් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමේ කොන්දේසි.

1. වැඩිම ඉල්ලුම්කාරයාට ඉඩම් විකුණනු ලැබේ. නියම කරණලද වටිනාකම් සඳහන්කර තිබේ.

2. වැඩි ඉල්ළුම්කාරයා අසවලායයි ප්‍රකාශකරණුලැබූ කල්හි ඔහු ඉල්ළුම්කරණලද මුදලෙන් සියයට දහයක් එකෙනෙහිම නොගෙව්වොත් කිසිම ඉල්ළුම්පත්‍රයක් අන්තිමට පිළිගන්නා නොවේ.

3. මිලයටගත් මුදලෙන් ඉතිරිහරිය ඉඩම් විකුණූ දිනයේ සිට මාසයක් තුළදී ඒජන්ත උන්නාන්සේට ගෙවිය යුතුයි. එසේකිරීම අතපසු කලොත් ඉඩම් මිලයට ගැණීම අවලංගු වෙනවා පමණක් නොව සියයට දහය බැගින් ගෙවූ මුදල සහ එම ඉඩම් ගැණ ගෙවනලද වෙනයම් මුදලක් ඇත්නම් ඒ සියල්ලම්ද රාජසන්තකවෙනවා ඇත.

4. නියම කරණලද කාලයතුළදී සම්පූර්ණ මුදල ඒජන්ත උන්නාන්සේට ගෙවූකල්හි ඉඩම් මිලයට ගත් තැනැත්තාට විකුණුම්කරයක් දෙනුලැබේ.

5. විකුණුම්කරය සූදානම්කරණ කාලයට හෝ එය දීමට ප්‍රථම මේ ඉඩම්වල ප්‍රමාණය මෙහි දක්වා තිබෙන ප්‍රමාණයට වඩා විශාලබව පෙණීගියොත් ගැණුම්කාරයා විසින් එම ඉඩමට ගෙවූ අක්කරයක වටිනාකමේ ප්‍රමාණයට ඒ වැඩි අක්කර ගණනටත් ගෙවිය යුතුයි. තවද මෙහි දී තිබෙන විශාලකමට වඩා ඉඩමේ ප්‍රමාණය අඩුබව පෙනීගියොත් තමා අක්කරයක් මිලයට ගත් ගණනේ ප්‍රමාණයට ආපසු මුදල් ලබාගැණීමට පුළුවන්කමද ඇත්තේය. තවද ගැණුම්කාරයා විසින් ගෙවා තිබෙන මුදල්වලට වන්දි වශයෙන් පොලී ඉල්ලීමට ඔහුට බලය නැත. ඉඩම් විස්තරකිරීමේදී හෝ ප්‍රමාණය ගැණීමේදී ප්‍රධාන මිනින්දෝරුතැනගේ විනිශ්චය අන්තිම තීන්දුව හැටියට ගණින්නනුලැබේ.

6. ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් ලියවිල්ලකින් දෙනලද බලපත්‍රයක් පිට සහ ආණ්ඩුකාර උතුමානන්වහන්සේ විසින් නියමකරණලද ගාස්තු සහ පණත්වලටත් යටත්ව මිස මිනිරන් හෑරීමේ බලය ආණ්ඩුවටම තබාගන මේ ඉඩම් විකුණනු ලැබේ.

7. ආණ්ඩුවේ ආදායමෙන් කරණලද හෝ කරවනු ලබන ජල කර්මාන්තයකින් මේ ඉඩම්වලට යම් ප්‍රයෝජනයක් ලැබුනොත් දැන් පවතින හෝ ඉදිරියට පණවනුලබන පණත්වල බලය පිට ඒ කර්මාන්ත පිණිස අක්කරය ගණනේ ගෙවියයුතු මුදල අයකිරීමට බලය ඇත්තේය.

8. යම්කිසි ඉල්ලීමක් හෝ සියළුම ඉල්ලුම් ප්‍රතික්ෂේපකිරීමට ඒජන්ත උන්නාන්සේට බලය ඇත්තේය.

ජේ. ජී. ෆ්‍රේසර්,
බස්නාහිර පලාතේ ඒජන්ත වම්හ.

වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 7වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

සඳහන්කළ ඉඩම්.

| ඉඩමේ නම. | පිහිටීම. | මහත. අ. රූ. ප. | වටිනාකම, රු |
|---|---|---|---|
| කුඩලුවිලකුඹුර .. | බෝපිටිය .. | 5 1 16 | 150 |
| මහම්නියා කනත්ත ගොරකගහවත්ත | එම .. | 4 2 26 | 525 |

මෙහි පහත සඳහන්වන මධ්‍යම දිසාවේ තොටුපල් රේන්ද වර්ෂ 1921ක්වූ ජනවාරි මස 1වෙනි දින පටන් දෙසැම්බර් මස 31වෙනි දින දක්වා මහනුවර නාගරික සභාවෙන් බදු ගැණීමට එවනලද මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර මහනුවර නාගරික සභාවේ ප්‍රධාන තැනැත්තා විසින් භාරගනු ලැබේ. මතුකී මුද්‍රලත් ඉල්ළුම්පත්‍ර මතුපිට හෙවත් ඇන්විලොප්උඩ Tender for Toll Rents "තොටුපල සඳහා ඉල්ලුම්පත්‍ර" යන වාසගම ඇතුව වර්ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 15වෙනි කිවිදින උදේ 8ට වන තුරු මහනුවර නාගරික සභාවට භාරගනු ලැබේ. එවිට එහිදී ඒවායේ මුද්‍ර කඩා බලනවා ඇත. තවද ඉල්ලුම්පත්‍ර දී සිටින සැමදෙනාම ඉදිරිපිටට ඇවිත් තමන්ගේ අතින්ම ඒවා බාරදෙන්ට ඕනෑය.

2. නාගරිකසභාවේ ප්‍රධාන තැනැත්තා විසින් නාගරික සභාවවෙත ඔප්පුකර සිටීමට තෝරාගන්නාලද ඉල්ලුම්පත්‍රය අයිතිකාරයා විසින් ඉල්ලාපු ගණනෙන් දහයෙන් කොටසකට වැටහෙන මුදල් ගණන සල්ලිවලින් වහාම ඇප තබන්ට ඕනාවා පමණකුත් නොව එම ඉල්ලීම නාගරික සභාව විසින් ඒත්තුගත්බව දැනුම්දුන් දින පටන් 30 දවසක් ඇතුළතදී එම ඉල්ලූ ගණනෙන් දෙකෙන්පංගුවකට වටිනා ඇප ඒත්තුගත් මුද්‍ර ඔප්පුවලින් හෝ තුනෙන් පංගුවකට වටිනා ඇප මුදලෙන් හෝ තිබා සම්පූර්ණකරන්ට ඕනෑය. ඔප්පුවලින් ඇප බඳිනවා නම් දහයෙන් එක වෙනුවට බැඳ තිබෙන මුදල රේන්දයේ ගණන් පියවා නිමවෙනතුරු එසේම තිබෙන්ට අරින්ට ඕනෑය.

3. ඇප පිණිස තබනලද ඔප්පු සෝදිසිකිරීම සඳහා අද්වකාත් උන්නාන්සේට ගෙවියයුතු ගාස්තුවද ඇප ඔප්පු සෑදීමටද, ඒවා සෝදිසිකර සම්පූර්ණකිරීමටද ඉඩම් තක්සේරු කිරීමට සහ ඇප ඔප්පු රෙජිස්තර්කිරීමටත් ගෙවියයුතු ගාස්තුත් ඔහු විසින් ගෙවන්ට ඕනෑය.

4. ඇප වෙනුවෙන් තබනලද ඉඩම්වල ඔප්පු ඒවා මීට ප්‍රථම ඇපේකට නොහොත් උකසකට යටත්නැති බවට ඉඩම් ලියා සටහන්කරණ රෙජිස්ත්‍රාර්තැනගෙන් සහතික පත්‍රයක් ලබාගත යුතුයි. මෙම සහතිකපත්‍රය ඇපදෙන තැනැත්තාගේ වියදමෙන් ලබාගත යුතුයි.

5. රේන්දකාරයා විසින් ඔහුගේම වියදමෙන් සෑහෙන ගණනක් ඔරු සහ තොටියෝද සපයා දෙන්ට සහ ආරක්ෂාකරන්ටද බැඳෙන්ට යෙදේ. එම ඔරු ඊට ඔබිනාවද යන වග සහ තොටියෝ ගණනද, නාගරික සභාවේ ප්‍රධාන තැනැත්තාගේ කැමැත්තට ඒත්තුවෙන අන්දමට වියයුතුයි. ප්‍රධාන කොට ලේවැල්ල සහ හල්ඔළුව තොටුපල්වල පාවිච්චිය පිණිස

නාගරික සභාව විසින් පාරුවක් සපයාදෙන්ට සහ ආරක්‍ෂා කරන්වද යෙදේ.

6. විකිනීමේ කොන්දේසිගැණ වැඩිදුර කාරණ නාගරික සභාවේ සෙක්‍රතාරිස් උන්නාන්සේගෙන් ඉල්ලුම්කළමිට දැන ගත හැකිවේ.

නාගරික සභාවට අයිති තොටුපල් රේන්ද.

1. ගෝනවත්තේ තොටුපල.
2. ලේවැල්ලේ තොටුපල.
3. හල්ඔළුව තොටුපල.
4. ඉළුක්මෝදර සහ කුණ්ඩසාලේ තොටුපල්.

සී. ඇස්. වෝන්,
මහනුවර නාගරික සභාවේ ප්‍රධානතැන.

වර්‍ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 12වෙනි
දින මහනුවර නාගරික සභාවේදීය.

---

පුත්තලමේ නැගෙණහිරපැත්තේ ලුණු දෙපාර්‍තමේන්තුවේ මුලාදෑනි වාසයකරණ ගෙවල් අළුත්වැඩියා කිරීමට ඉල්ලුම් පත්‍ර භාරගනුලැබේ.

2. ඉල්ලුම්පත්‍ර සීල්කර වහතලද ඇන්විලොප් තුළ දමා එවන්ට ඕනෑය. එම ඇන්විලොප් උඩ වම්පැත්තේ කොනේ මින් පහත සඳහන් වචන ලියා තියෙන්ට ඕනෑය. "පුත්තලමේ නැගෙණහිර පැත්තේ ලුණු දෙපාර්‍තමේන්තුවේ මුලාදෑනි වාසයකරණ ගෙවල් අළුත්වැඩියා කිරීමට ඉල්ලුම්පත්‍රයයි" තවද මෙකී එම ඉල්ලුම්පත්‍රය වර්‍ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 3වෙනි දින සවස 1ට ඔත්තෙන් පුත්තලමේ ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේට ලැබෙන පිණිස එවන්ට ඕනෑය.

3. ඉල්ලන්ට අදහස්කරණ තැනැත්තා ඔහුගේ ඉල්ලුම් පත්‍රය එවන්ට මත්තෙන් කොයිම කච්චේරියක හරි "ටැන්ඩර් ඩෙපෝසිට්" යන ගණන යටතේ රුපියල් 10ක් බැඳ රිසිට් එකක් ලබාගන්ට ඕනෑය. එම රිසිට් එක ඔහුගේ ඉල්ලුම් පත්‍රයට යාකරඑවන්ට ඕනෑය.

4. මෙකී රුපියල් දහය (10) ඉල්ලුම්කාරයෙකුගේ ඉල්ලුම් පත්‍රය භාරගත් කල්හි එම ඉල්ලුම්කාරයා භාරගත් වැඩේ නිසියාකාර කරදෙනවාය කියා උප ඒජන්ත උන්නාන්සේ සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙන පිණිස ඇපයක් වශයෙන් තබාගන්ට යෙදේ. එසේ ඉල්ලුම්පත්‍රය භාරගෙණ සුදුසු කාලයක් තුළදී එකී කොන්ත්‍රාත්තුවකට බැඳෙන්ට නොයෙදුනොත් එම රුපියල් දහය (10) රාජසන්තක කරණු ලැබේ.

5. ඉල්ලුම්කාරයාට පුත්තලමේදී ලියුම් ලැබෙන්ට නොහොත් භාරදීම පිණිස ඇඩ්‍රෙස් එකක් සඳහන්කරන්ට ඕනෑය.

6. කොන්ත්‍රාත්තුවට බැඳුනායින් පසු සුමාන හතරක් ඇතුළතදී වැඩේකර ඉවරකරන්ට ඕනෑය.

7. වැඩිදුර කාරණ පුත්තලමේ කච්චේරියෙන් දැනගන්ට පුළුවන.

කරන්ට තිබෙන වැඩවල විස්තර.

දැනට ගොඩනැගිලිවල තිබෙන සියලුම දිරච්ච සහ වෙනයම් විදියකට පාවිච්චිකරන්ට බැරි ලීදඬු පොල්අතු යනාදිය අහක් කොට ඒවා වෙනුවට අළුත් සහ සවිඇති ඒවා දමන්ට ඕනෑය.

සුපර්වයිසර්තැනගේ බංගලාවේ වහලේ ඕනෑකරණතැන් අළුත්වැඩියාකරන්ට ඕනෑය. එනම් පාවිච්චියට නුසුදුසු රීප සහ උලුත් අහක්කොට ඒවා වෙනුවට අළුත් ඒවා දමන්ට ඕනෑය. ගෙයිබිම අළුත්වැඩියාකොට සිමෙන්ති දමන්ටඕනෑය.

සුපර්වයිසර්තැනගේ කුස්සියේ වහලද, පළමුවෙනි කලෑසියේ කොස්තාපල්ගේ බංගලාවේ සහ කුස්සියෙත් වහලවල් සහ පැට්‍රෝල්කාර හයදෙනාගේ ගෙවල්වල වහලවලුත් අළුත් වැඩියාකර අළුත් පොල්අතුවලින් සෙවිලිකරන්ට ඕනෑය. තවද එම වහලවල් උඩ බර වෙනුවට මාංගු දමන්ට ඕනෑය.

සුපර්වයිසර්තැනගේ සහ පළමුවෙනි කලෑසියේ කොන්ස්තාපල්ගේත් ගෙවල්වල සහ කුස්සිවලත් බිත්ති රෙපෙයාර්‍රුකර, කපලාරුකර සුදුහුණුගාන්ට ඕනෑය. පළමුවෙනි කලෑසියේ කොන්ස්තාපල්ගේ ගෙයි බිත්තිවල තිබෙන වේහුබස් නැති කරන්ට ඕනෑය.

පළමුවෙනි කලෑසියේ කොන්ස්තාපල්ගේ බංගලාවේද, කුස්සියේ සහ පැට්‍රෝල්කාරයෝ හයදෙනාගේ ගෙවල්වලත් ගෙයි බිම අළුත්වැඩියාකොට ගොමගාන්ට ඕනෑය.

සුපර්වයිසර්තැනගේ සහ පළමුවෙනි කලෑසියේ කොන්ස්තාපල්ගේ ගෙවල්වලට අයිති වැසිකිළි අළුත්වැඩියාකොට වහලවල්වලට අළුත් පොල්අතු බඳින්ට ඕනෑය.

සුපර්වයිසර්තැනගේ සහ පළමුවෙනි කලෑසියේ කොන්ස්තාපල්ගේත් බංගලාවල්වලට අයිති සියළුම දොරවල්ද, ජනේලද කනු සහ මැව්පාට රතුපාටින් තීන්තගාන්ට ඕනෑය.

සුපර්වයිසර්තැනගේ කුස්සියට අයිති 13′ × 11′ මහත ඇති මුදුන් බිච්චියක් කඩාදමා ඒ වෙනුවට අළුතෙන් බිත්තියක් සාදා කපලාරුකරන්ට ඕනෑය.

මුරකාර හාසිම්ගේ සහ සෙබස්තියන්ගේත් ගෙවල්වලට දොර පියන් දෙකක් සහ මුරකාර මිගෙල්ගේ සහ රෝචිගේ ගෙවල්වලට අලුත් යතුරු තහඩු දෙකක් සවිකරන්ට ඕනෑය. රෝචිගේ ගෙයි දොර අළුත්වැඩියාකරන්ට ඕනෑය. මුරකාර මූන්ඩුගේ සහ මිගෙල්ගේ ගෙවල්වල බිම් අඟල් 3ක් උස් කරන්ට ඕනෑය.

මතුකී සෑම බංගලාවලට සහ ගෙවල්වලටත් වටේ තිබෙන වැටවල් අළුත් ඉනි හිටවා පොල්අතු අල්ලන්ට ඕනෑය.

ඇස්. ඇම්. පී. වැන්ඩර්කෝන්,
උපඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්‍ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 12වෙනි
දින පුත්තලම් කච්චේරියේදීය.

---

වර්‍ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 15වෙනි දින සිට 1922ක්වූ අප්‍රේල් මස 30වෙනි දින දක්වා පුත්තලමේ ලුණු ස්ටෝරුවලත් ලුණු ගෙනගොස් කිරා උඩප්පුවේ ලුණු ස්ටෝරුවලට භාරදීමට කොන්ත්‍රාත්ගැණීම සඳහා ටැන්ඩර්යයි පිටකොලේ ලියා එවන මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර වර්‍ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින සවස 1ක වනතුරු පුත්තලමේ උප ඒජන්ත උන්නාන්සේ විසින් භාරගනු ලැබේ.

ඉල්ලුම්කාරයන් විසින් මෙහි සඳහන් උවමනාවල් සිත්හි ගතයුතුයි.

(*a*) වර්‍ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දිනට මත්තෙන් රු. 20ක් ඉල්ලුම්කාරයා විසින් කොයිම කච්චේරියක නුමුත් බඳින්ට ඕනෑය. ඉල්ලුම්කාරයින්ගේ ඉල්ලීම ඒත්තුගත්තායින් පසු උප ඒජන්ත උන්නාන්සේ විසින් නියමකරණ සෑහෙන කාලයක් ඇතුළතදී ඉල්ලුම්කාරයා විසින් කොන්ත්‍රාත්තුවට බැඳෙන්ට බැරිවුනොත් එකී බැඳ තිබෙන මුදල තහනමට ගනු ලැබේ.

(*b*) ඉල්ලුම්පත්‍රය උප ඒජන්ත උන්නාන්සේට යවන්නාවූ වේලාවටම එකී ඉල්ලුම්පත්‍රයේ පිටපතක් ඉල්ලුම්කාරයා විසින් කැප්පෑලෙන් කොළඹ ගරුකටයුතු ආදායම් පරීක්ෂකතුමාට යැවිය යුතුයි.

(*c*) ඉල්ලුම්කාරයින්ට නොතිසි භාරදීමට පුත්තලමේ ස්ථානයක් ඔවුන් විසින් නියම්කළ යුතුයි.

(*d*) උඩප්පුවට පුත්තලමේ සිට ගෙනයන ලුණු ගොණ්ඩර 280ක් පටවන සෑම පාරුවටම කුලිය වෙන් වෙන් වශයෙන් ටැන්ඩර්කාරයන් විසින් සඳහන්කළ යුතුයි. වැඩිදුර කාරණ පුත්තලමේ කච්චේරියෙන් දැනගන්ට පුළුවන.

ඇස්. ඇම්. පී. වැන්ඩර්කෝන්,
උප ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්‍ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 12වෙනි
දින පුත්තලම් කච්චේරියේදීය.

---

මෙයින් දැනුම්දෙන්නේ නම් 1921කේ ඔක්තෝබර් මස 8වෙනි සෙනසුරාදා සවස 3ට මෙහි පහත සඳහන් ලෝකල් බෝඩ් එකේ 1922ට විකිණීයයුතු බදු කච්චේරියේදී අනුරාධපුරේ ලෝකල් බෝඩ් එකේ ප්‍රධානතැන විසින් වෙන්දේසිකරන්ට යෙදෙනවා ඇත.

1. මාර්කට් බද්ද. 2. ගාල්වල බද්ද.
3. තණකොල බද්ද.

ඒ. ඩබ්ලිව්. සෙසිමූර්,
සෞඛ්‍යසභාවේ ප්‍රධානතැන.

වර්‍ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 10වෙනි දින
අනුරාධපුර ලෝකල් බෝඩ් කන්තෝරුවේදීය.

---

සීල් තබන්නට යෙදුන ඉල්ලුම්පත්‍ර අනුරාධපුරේ සෞඛ්‍යසභාවට 1922ක්වූ ජනවාරි මස 1වෙනි දින පටන් "කරත්ත සහ ගොන් සපයාදීමට" කියා පිටකවරේ සඳහන්කර ඉල්ලුම්පත්‍ර සෞඛ්‍යසභාවේ ප්‍රධානතැන විසින් වර්‍ෂ 1921 ඔක්තෝබර් මස 8වෙනි සෙනසුරාදා දවල් 12ට භාරගන්නට යෙදෙනවා ඇත.

2. ඉල්ලුම්පත්‍රය කරත්ත පහක් සහ ගොන්බාන් පහකුත් කුණු ඇදීමට ගොන්බාන් 4ක් කක්කුස්සි කරත්ත 3ට සහ කුණුවතුර කරත්තයට (කක්කුස්සි කරත්ත සහ කුණුවතුර කරත්තය සභාවෙන් සපයාදෙනවා ඇත).

3. තෝරගත්තාවූ ඉල්ළුම්කාරයා විසින් කොන්ත්‍රාත්තුව හරියාකාරකිරීම පිණිස මුදලෙන් රුපියල් 500ක ඇප බදින්නට ඕනෑය.

4. ප්‍රධානතැන අඩු හෝ යම්කිසි ඉල්ළුම්පත්‍රයක් බාරගන්නට බැඳෙන්නේ නැත.

5. වැඩිදුර කාරණ ලෝකල් බෝඩ් කන්තෝරුවෙන් දැනගන්නට පුළුවන.

6. ඉල්ළුම්කාරයින් විසින් රුපියල් 50ක් මුදලෙන් ඇපයක් හැටියට බදින්ට ඕනෑය. එසේ ඇප බැන්දේ නැත්නම් ඉල්ළුම්පත්‍රය බාරගන්නේ නැත.

ඒ. ඩබ්ලිව්. සෙයිමූර්,
ප්‍රධානතැන.

වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 10වෙනි දින
අනුරාධපුරේ සෞඛ්‍යසභාවේ කන්තෝරුවේදීය.

## රා සහ අරක්කු තැබෑරුම් සම්බන්ධ වර්ෂ 1912යේ අංක 8 දරන ව්‍යවස්ථාව යටතේ දැන්වීම.

### වර්ෂ 1912, අංක 8, මත්පැන් සම්බන්ධ ආඥාවයටතේ දැන්වීමයි.

වර්ෂ 1921ක්වූ ජූනි මස 10වෙනි දින අංක 123 දරණ මත්පැන් සම්බන්ධ දැන්වීමේ ප්‍රකාශකරණලද පනත්වල අංක 5 නියෝගයෙන් දෙනුලැබූ බලය ප්‍රකාර දකුණු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් දෙඩන්ගොඩ අරක්කු තැබෑරුමෙන් ප්‍රයෝජනය දරණ පලාත්වල ඇගබද්ද ගෙවන අයවළුන්ගෙන් සියේට 75 බැගින් ඒ පලාත්වල අරක්කු විකිණීම සඳහා තැබෑරුම පිහිටුවීමට විරුඬද යන බව දැනගැණීම පිණිස කැමැත්ත දෙන අයවල් ගණන් ගැණීමට මෙහි පහත දක්වන දින සහ ස්ථානය නියමකර තිබෙන බව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රකාශ කරණුලැබේ.

වර්ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 11වෙනි දින පස්වරු 2 සිට 4.30 වනතුරු ගාළු දිස්ත්‍රික්කේ ගගබඩපත්තුවේ ගිණිමැල්ලගහ නැගෙණහිර පිහිටි කිතුල්ගස්තුඩුවේවත්ත හොගොත් මොලිගේවත්තේදීය.

මෙම තැබෑරුමෙන් ප්‍රයෝජනය ලබන ගම්නම්: ලෙල්කඩ, ගිණිමැල්ලගහ නැගෙණහිර සහ බස්නාහිරත්ය.

වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 12වෙනි
දින ගාල්ලේ කච්චේරියේදීය.

ඇෆ්. බාව්ලව්,
දකුණු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

---

### වර්ෂ 1912, අංක 8, මත්පැන් සම්බන්ධ ආඥාවයටතේ දැන්වීමයි.

වර්ෂ 1921ක්වූ ජූනි මස 10වෙනි දින අංක 123 දරණ මත්පැන් සම්බන්ධ දැන්වීමේ ප්‍රකාශ කරණලද පනත්වල අංක 5 නියෝගයෙන් දෙනුලැබූ බලය ප්‍රකාර දකුණු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් යටලමත්තේ අරක්කු තැබෑරුමෙනේ ප්‍රයෝජනය දරණ පලාත්වල ඇගබද්ද ගෙවන අයවලුන්ගෙන් සියේට 75දෙන බැගින් ඒ පලාත්වල අරක්කු විකිණීම සඳහා තැබෑරුම පිහිටුවීමට විරුඬද යන බව දැනගැණීම පිණිස කැමැත්ත දෙන අයවල් ගණන් ගැණීමට මෙහි පහත දක්වන දින සහ ස්ථානය නියමකර තිබෙන බව මහජනයාගේ දැනගැණීම සඳහා මෙයින් ප්‍රකාශ කරණුලැබේ.

වර්ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 12වෙනි දින පස්වරු 2 සිට 4.30 දක්වා ගාළු දිස්ත්‍රික්කයේ ගගබඩපත්තුවේ යටලමත්ත ආණ්ඩුවේ ස්වභාෂා පිරිමි පාඨශාලාවේදීය.

මෙම තැබෑරුමෙන් ප්‍රයෝජනය ලබන ගම්නම්: යටලමත්ත සහ කැප්පිටියාගොඩත්ය.

වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 12වෙනි
දින ගාල්ලේ කච්චේරියේදීය.

ඇෆ්. බාව්ලව්,
දකුණු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

---

### වර්ෂ 1912 අංක 8 මත්පැන් සම්බන්ධ ආඥාව යටතේ දැන්වීමයි.

වර්ෂ 1921ක්වූ ජූනි මස 10වෙනි දින දරණ අංක 123 මත්පැන් සම්බන්ධ දැන්වීමේ ප්‍රකාශකරණලද පනත්වල අංක 5 නියෝගයෙන් දෙනුලැබූ බලය ප්‍රකාර දකුණු පලාතේ ඒජන්ත උන්නාන්සේ විසින් ඉහලගොඩ අරක්කු තැබෑරුමෙන් ප්‍රයෝජනය දරණ පලාත්වල ඇගබද්ද ගෙවන අයවලුන්ගෙන් සියේට 75 දෙන බැගින් ඒ පලාතයේ අරක්කු තැබෑරුම පිහිටවීමට විරුඬද යන බව දැනගැණීම පිණිස කැමැත්තදෙන අයවල් ගණන්ගැණීමට මෙහි පහත දක්වන දිනය සහ ස්ථානය නියමකර තිබෙන බව මහජනයාගේ දැනගැණීම පිණිස මෙයින් ප්‍රකාශකරණු ලැබේ.

වර්ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 14වෙනි දින පස්වරු 2 සිට 4.30 දක්වා ගාල්ලේ කඩවත්සතරතුළ ඉහලගොඩ ගම්සභා උසාවියේදීය.

මෙම තැබෑරුමෙන් ප්‍රයෝජනය දරණ පලාත්නම්: ඉහලගොඩ, ඉදිගහතොට, බදුන්ගොඩ, ආඹගොඩ, එඬේරගොඩ, නවන්දන්නාගොඩ, අඹගහඹිට සහ ඔකන්දගොඩත්ය.

වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 12වෙනි
දින ගාල්ලේ කච්චේරියේදීය.

ඇෆ්. බාව්ලව්,
දකුණු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

---

### වර්ෂ 1912 අංක 8 මත්පැන් සම්බන්ධ ආඥාව යටතේ දැන්වීමයි.

වර්ෂ 1921ක්වූ ජූනි මස 10වෙනි දින දරණ අංක 124 මත්පැන් සම්බන්ධ දැන්වීමේ ප්‍රකාශකරණලද පනත්වල අංක 5 නියෝගයෙන් දෙනුලැබූ බලය ප්‍රකාර දකුණු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් කතලුවේ රා තැබෑරුමෙන් ප්‍රයෝජනය දරණ පලාත්වල ඇගබද්ද ගෙවන අයවලුන්ගෙන් සියේට 75 දෙන බැගින් ඒ පලාත්වල රා තැබෑරුම පිහිටවුමට විරුඬද යන බව දැනගැණීම පිණිස මෙහි පහත දක්වන දිනය සහ ස්ථානය නියමකර තිබෙන බව මහජනයාගේ දැනගැණීම පිණිස මෙයින් ප්‍රකාශකරනුලැබේ.

වර්ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 6වෙනි දින පස්වරු 12.30 සිට 4.30 වනතුරු ගාළු දිස්ත්‍රික්කයේ තල්පේපත්තුවේ කතලුවේ ආණ්ඩුවේ පිරිමි පාඨශාලාවේදීය.

මෙම තැබෑරුමෙන් ප්‍රයෝජනය ලබන ගම්නම්: කතලුව නැගෙණහිර, කතලුව බස්නාහිර සහ කතලුව මධ්‍යමත්ය.

වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 12වෙනි
දින ගාල්ලේ කච්චේරියේදීය.

ඇෆ්. බාව්ලව්,
දකුණු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

---

### ප්‍රදේශීය කැමත්ත.

මණ්ඩාඩුවේ අරක්කු තැබෑරුමෙන් අරක්කු සපයන්ට යෙදෙන පලාතේ (මණ්ඩාඩුව, බුද්දියගම, කපුගම්පොත සහ මුල්කිරිගල) පාරබද්ද ගෙවන වැසියන්ගෙන් සියයට 25දෙනෙක් එකී තැබෑරුම තිබීමට විරුඬ බැව් හම්බන්තොට ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේට වැටහී ගියෙන්, වර්ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 10වෙනි සඳුදා වීරකැටියේ ගන්සභා කොමිටියේ බංගලාවේදී දවල් 11 සිට සවස 4 දක්වා කාලය තුළ වර්ෂ 1921ක්වූ ජූනි මස 10වෙනි දින නො: 123 දරණ මද්‍ය දැන්වීමේ ප්‍රකාරයට කැමැත්ත හෝ අකමැත්ත ප්‍රකාශකරන අයවළුන්ගේ ගණන් (බැලට්) ලේඛනයක් ගන්ට යෙදෙන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 9වෙනි
දින හම්බන්තොට කච්චේරියේදීය.

ඒ. පි. බූන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්ග.

## සනීපාරක්‍ෂක සභාවලට නිලනොලත් සමාජිකයින් තෝරාගැනීමේ දැන්වීම.

(මොරටුවේ ප්‍රදේශික සභාව.)

මොරටු නගරයේ සනීපආරක්‍ෂක සහ නගරාභිවෘද්ධි සමිතියට අයිති රවතාවත්ත කොට්ඨාසය වෙනුවෙන් වර්‍ෂ 1921යේ දෙසැම්බර් මස 31වෙනි දින දක්වා තිබෙන කාලයට නිල නොලත් සමාජිකයෙක් තෝරාගැනීම පිණිස වර්‍ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 21වෙනි දින උදේ 10ට මොරටුවේ ප්‍රදේශික සභා කන්තෝරුවේදී සභාරැස්වීමක් පවත්වනු ලබන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

සමාජිකයන් වෙනුවෙන් ඉදිරියට එන සෑමදෙනාගේම නම් ලියවිල්ලකින් යෝජනාකළ යුතුයි. තවද නම් යෝජනාකරන ලියවිලි කැමැත්තදීමට බලය ඇති අයගේ නාමලේඛනයේ පෙණෙන ඇත්තන්ගෙන් අඩුගණනේ දෙදෙනෙකු විසින් ස්ථිරකරනු ලැබිය යුතුයි.

එම ලියවිලි යටකී කාරනාව සඳහා නියමකර තිබෙන වේලාවවූ වර්‍ෂ 1921යේ ඔක්තෝබර් මස 10වෙනි දින දවල් 12ට හෝ ඊට ප්‍රථම යටකී ප්‍රදේශික සභා කන්තෝරුවට භාරදිය යුතුයි.

සමාජිකයන්වීමට ඉදිරියට එන අයගෙන් එක්කෙනෙකුට වැඩිගණනක් යෝජනාකරනු ලැබුවොත් සමාජිකයන් තෝරාගැනීමක් යටකී වේලාවට යටකී ස්ථානයේදී කරනුලැබේ.

තෝරාගැනීම උදේ 10ට පටන්ගෙන 3ට අවසානකරනු ලැබේ.

ජේ. ජී. ප්‍රේසර්,
බස්නාහිර පලාතේ ඒජන්ත වම්හ.

වර්‍ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 12වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

---

සනීපාරක්‍ෂක සභාවලට නිල නොලත් සමාජිකයන් තෝරාගැනීමේ දැන්වීමයි.

වර්‍ෂ 1921ක්වූ දෙසැම්බර් මස 10වෙනි දින පවත්වන්ට යන ජපනේ ලෝකල්බෝඩ් සභාවට වර්‍ෂ 1922යේ සහ 1923නේ අවුරුදුවලට නිලනොලත් සමාජිකයන් පත්කිරීමේ රැස්වීමේදී නිල නොලත් සමාජිකයන් මෙන් පත්කරනු ලැබීමට සුදුස්සන්ගේද කැමැත්තදීමට සුදුස්සන්ගේද නාමලේඛනය ඉහතකී සභාවේ කන්තෝරුව පවත්වන කාලයතුලදී එහිදී කියවා බැලීමට අවකාශ ඇර තිබෙන බවද ඉහතකී ලේඛනවල ඇතුළත්කිරීමට යම් නමක් තිබේනම් ඒ ගැන තිබෙන අයිති වාසිකම්වලටද ඇතුළත්කර තිබෙන නමකට විරුඬව යමක් කියන්ට තිබේනම් ඒවද ඇහුම්කන්දීම පිනිස වර්‍ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 7වෙනි දින දවල් 2කට මා ඉහතකී කන්තෝරුවට පැමිණෙන බවද මෙයින් දැනුම්දෙන්ට යෙදුනා ඇත.

බී. කොන්ස්ටන්ටයින්,
උතුරුපලාතේ ඒජන්ත උන්නාන්සේ.

වර්‍ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 5වෙනී දින
ජපනේ ලෝකල්බෝඩ් කන්තෝරුවේදීය.

---

ජපනයේ කච්චේරියේ සභාවේ උපදේශික තනතුරුවලට පත්කෙරීමයි.

වර්‍ෂ 1922යේ සහ 1923නේ අවුරුදුවලට සනීපආරක්‍ෂක සභාවේ උපදේශික තනතුරුවලට අයවල් 3දෙනෙක් තෝරාගැනීම සඳහා මෙම දෙසැම්බර් මස 10වෙනි සෙනසුරාදා උදේ 9ට සභාරැස්වීමක් පවත්වන බව මෙයින් දැනුම්දෙමි. යම් යම් කෙනෙකුගේ නාම ඇතුලත් කෙරීම වර්‍ෂ 1921යේ නොවැම්බර් මස 30වෙනි බදාදා උදේ 11හෙන් පසු බාරගනු නොලැබේ.

බී. කොන්ස්ටන්ටයින්,
උතුරුපලාතේ ඒජන්ත උන්නාන්සේ.

වර්‍ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 5වෙනි දින
ජපනේ ලෝකල්බෝඩ් කන්තෝරුවේදීය.

---

## සුප්‍රිම් උසාවියේ දැන්වීම්.

ශ්‍රී ලංකාවීපයේ ගරු කටයුතු උතුම්වූ සුප්‍රිම් උසාවියෙන් මට ලැබීතිබෙන ආඥාවක බලය කරණකොටගෙන මෙයින් ප්‍රකාශකරන්නේනම් බස්නාහිර දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්‍ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 10වෙනි දින පෙරවරු 11 පැය පටන් කොළඹ අළුත්කඩේ තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණා ඇතුව සිටින සෑමදෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීහිටින්ට ඔහුවත් ඇර අවසර ඉල්ලා ලබාගෙන මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙයින් සැමදෙනාටම දන්වන්නෙමි.

ඩබ්ලිව්. ද ලිවේරා,
ඉදි. පිස්කල් වෙනුවට.

වර්‍ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 8වෙනිදින
කොළඹ පිස්කල් කන්තෝරුවේදීය.

---

ශ්‍රී ලංකාවීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රිම් උසාවියෙන් මට ලැබීතිබෙන ආඥාවක බලය කරණකොටගෙණ මෙයින් ප්‍රකාශකරන්නේ නම් හලාවත පුත්තලම දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාය වර්‍ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 10වෙනි දින පෙරවරු 11 පැය පටන් කොළඹ තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණා ඇතුව සිටින සෑමදෙනාම යටකී ස්ථානයට යටකී වෙලාවට ඇවිත් පෙණීහිටින්ට ඔහුවත්ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බව මෙයින් සැමදෙනාටම දන්වන්නෙමි.

ඇස්. ඩී. සමරසිංහ,
වයඹ දිසාවේ පිස්කල් වෙනුවට.

වර්‍ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 12වෙනි දින
කුරුණෑගල පිස්කල් කන්තෝරුවේදීය.

---

ශ්‍රී ලංකාවීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රිම් උසාවියෙන් මට ලැබීතිබෙන ආඥාවක බලය කරණකොටගෙණ මෙයින් ප්‍රකාශකරන්නේනම් රත්නපුර අවිස්සාවේල්ල දිසාවේ ක්‍රිමිනෙල් නඩුවිභාගය වර්‍ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 10වෙනි දින පෙරවරු 11 පැය පටන් කොළඹ තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණා ඇතුව සිටින සැමදෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීහිටින්ට ඔහුවත්ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙයින් සැමදෙනාටම දන්වන්නෙමි.

එච්. ඩබ්ලිව්. කොඩ්රිංටන්,
පිස්කල් වම්හ.

වර්‍ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 13වෙනි දින
රත්නපුරේ පිස්කල් කන්තෝරුවේදීය.

---

## අන්‍ය දැන්වීමයි.

කළුතර දිස්ත්‍රික්කුවේ පානදුරතොටමුනේ පානදුරබද්දේ, වලානේ පදිංචි දෙන් බාර්න්ස් ප්‍රැන්සිස් කරුනාරත්න වන මා කළුතර දිස්ත්‍රික්කුවේ සිංහල භාෂාවෙන් වැඩකරන ප්‍රසිඬ නොතාරිස් කෙනෙකුමෙන් පත්කරනලෙස රිජිස්ත්‍රාර් ජනරල් තුමාගෙන් ඉල්ලන්ට අදහස්කර සිටිනබව මෙයින් දැනුම්දෙමි.

වර්‍ෂ 1921ක්වූ ජූනි මස 7වෙනි
දින පානදුර වලානේදීය.

ඩී. බී. ඇෆ්. කරුනාරත්න.

H. R. COTTLE. GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.